**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන - 2019**

-----------------------------------------------------------------

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල (IFAD) අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග 2017 ජුනි 26 දින එළඹි අංක 2000001843 දරන ණය ගිවිසුමේ 9.03 වගන්තිය හා 2017 නොවැම්බර් 21 දින එළඹි අංක 2000001984 දරන අතිරේක අරමුදල් සඳහා වූ ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ .

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනෙහි කාලසීමාව

-----------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට ජනාධිපති ලේකම් කාර්යාලය, වර්තමානයේ කෘෂිකර්ම අමාත්‍යාංශය කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති නියෝජිත ආයතනය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයයි. ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්ගේ දරිද්‍රතාවය අවම කිරීම සහ තරඟකාරිත්වය සඳහා දායක වීම සහ වාණිජමය වශයෙන් නැඹුරු නිෂ්පාදන හා අලෙවිකරණ පද්ධතිවල නියැලී සිටින කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන් 57,500 දෙනෙකුගේ ආදායම සහ ආහාරවල ගුණාත්මකභාවය තිරසාරව ඉහළ නැංවීම මෙම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 105.04 කට සමාන රු. මිලියන 17,172.42 ක් වූ අතර ඉන් එජඩො මිලියන 54.4 කට සමාන රු. මිලියන 8,893.58 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල එජඩො මිලියන 19.4 ක් ශ්‍රී ලංකා රජය විසින් ද සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් එජඩො මිලියන 9.8 ක්, සම මූල්‍යකරණ පුද්ගලික අංශය විසින් එජඩො මිලියන 17 ක් සහ ප්‍රතිලාභී දායකත්වයෙන් එජඩො මිලියන 4.5 ක් මූල්‍යනය කරනු ලැබේ. මෙම වැඩසටහන 2017 ජුනි 26 වන දින එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර එය 2023 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (IPSAS) අනුකූලව සහ IFAD විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අනු අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | අවදානම් ඇගයීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | | | |
| (අ) | රජයේ දායකත්වය ලෙස වාහන වශයෙන් ලැබී තිබුණු රු.58,023,311 ක් වාහන ලෙස වෙන වෙනම හෙලිදරව් නොකර මූල්‍ය ප්‍රකාශනවල නිදහස් කිරීම් යටතේ වැරදි ලෙස දක්වා තිබුණි. | 58.02 | මධ්‍යම | මූල්‍ය ප්‍රකාශනයේ අවිධිමත් අනාවරණය කිරීම. | එය බෙදා හැරීම යටතේ උපකරණ හා ද්‍රව්‍යවල ඇතුළත් කර ඇත. | වැඩසටහනට අයත් වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කළ යුතු බව. |
| (ආ) | එවකට කාර්යාලය පිහිටුවා තිබූ ගොඩනැගිල්ලේ රු.3,294,600 ක ආපසු ගෙවිය යුතු තැන්පතුවක් ලැබියයුතු වටිනාකමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 3.29 | මධ්‍යම | මූල්‍ය ප්‍රකාශනයේ අවිධිමත් අනාවරණය කිරීම | බෙදා හැරීම යටතේ පුනරාවර්තන වියදමට එය ඇතුළත් කර ඇත. | ආපසු ගෙවිය යුතු තැන්පතුව ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කළ යුතු බව. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් (RDD) ලබාගත් තහවුරු කිරීම් අනුව ණය සංරචකයේ වටිනාකමෙහි රු.137,128,149 ක වෙනසක් | 137.12 | මධ්‍යම | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු වෙනත් සාක්ෂි සමඟ එකඟ නොවීම. | වර්ෂය තුළදී SAPP විසින් බෙදා හරින ලද මාර්ගස්ථ මුදල් රු. 9,966,031.93 ක වටිනාකම වෙනසට හේතුවී ඇති නමුත් 2020 ජනවාරි 08 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු අනුව වෙනත් සාක්ෂි මත පදනම්ව වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතු බව. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නිරීක්ෂණය විය. | | | | (CBSL) හි දී උපලබ්ධි වී තිබුණි. | |
| (ඈ) | ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රු.246,162,117 ක මුදල, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල ණය සංරචකයේ වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | 246.16 | මධ්‍යම | මූල්‍ය ප්‍රකාශනවල වියදම රු.246,162,117 කින් වැඩියෙන් දැක්වීම. | IFAD උපදෙස් අනුව කටයුතු කරන ලදි. | තථ්‍ය වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතු බව. |
| (ඉ) | මෝටර් රථ හැර අනෙකුත් වත්කම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකර ඓතිහාසික පිරිවැය, ප්‍රතිස්ථාපන පිරිවැය සහ තථ්‍ය පිරිවැය යන විවිධ පදනම් තුන මත මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | 20.53 | මධ්‍යම | මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති වත්කම්වල වටිනාකම වැඩියෙන් දැක්වීම. | SAPP විසින් මිලදී ගන්නා භාණ්ඩ ඓතිහාසික පිරිවැය පදනම මත දක්වා ඇති අතර SAPP වෙත මාරු කරන ලද වත්කම් දූත මණ්ඩල එකඟතා ක්‍රියාකාරකම් අනුව IFAD උපදෙස් ප්‍රකාරව අගය කර තිබේ. | තථ්‍ය වියදම් මූල්‍ය ප්‍රකාශනවලට මනා තක්සේරුකරණ ක්‍රමයක් මත පදනම්ව වත්කම්වල සත්‍ය වටිනාකම අනාවරණය කළ යුතු බව. |
| (ඊ) | රු.332,806,639 ක් වූ ප්‍රතිලාභී දායකත්වයේ වටිනාකම හඳුනා ගැනීම සඳහා යෝග්‍ය තක්සේරු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. වැඩසටහනේ දායකත්වය තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ වල දක්වා ඇති යෝග්‍ය ක්‍රමය අනුගමනය කිරීම වෙනුවට සමහර අවස්ථාවල දී වර්ෂය මැද භාගයේදී අභ්‍යන්තර විගණක විසින් කරන ලද ඇගයීම මත පදනම්ව සමාගමේ දායකත්වය රු. | 595.99 | මධ්‍යම | ප්‍රතිලාභියාගේ දායකත්වයේ සත්‍ය වටිනාකම සහ සමාගමේ දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන්/ අඩුවෙන් දක්වා තිබීම. | ගොවි දායකත්වය - ගොවීන්ගේ දායකත්වය ගණනය කිරීම සඳහා භාවිතා කරන මාර්ගෝපදේශය ඔබගේ දැනගැනීම සඳහා අමුණා ඇත (ඇමුණුම 7) . කෙසේ වුවද, යෝජිත කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සමඟ, සමාගමට සහ ප්‍රතිලාභියාගේ දායකත්වය ඉදිරි මූල්‍ය | ගොවීන්ගෙන් සහ සමාගමෙන් ලබාගත් ප්‍රතිලාභී දායක මුදල් සඳහා යෝග්‍ය තක්සේරු ක්‍රම හඳුනාගත යුතු බව. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 263,183,194 ක් ලෙස හඳුනාගෙන තිබුණි. | | | | ප්‍රකාශනවල වඩාත් නිවැරදිව සොයා ගැනීමට හැකි වනු ඇත. | |
| (ඇ) | මීට පෙර ක්‍රියාත්මක කරන ලද ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙන් (NADEP) ලැබුණු රු. 58,023,311 ක් වූ මෝටර් වාහන තුනක වටිනාකම හිමිකාරිත්වය පැවරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණු මෝටර් රථ 03 ක් මෙම වැඩසටහන මගින් භාවිතා කර තිබුණු අතර මෝටර් රථවල අයිතිය පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 58.02 | මධ්‍යම | වාහනවල හිමිකාරිත්වය පවරා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති වත්කම්වල සත්‍ය වටිනාකම වැඩියෙන්/ අඩුවෙන් දක්වා තිබීම. | වාහනවල අයිතිය පවරා ගැනීමට පියවර ගෙන තිබේ. | වත්කම්වල සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළි කළ යුතු අතර මෝටර් වාහනවල අයිතිය තවදුරටත් ප්‍රමාදයකින් තොරව වැඩසටහනට පවරා ගත යුතු බව. |

## 2.2 නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් / විගණන නිරීක්ෂණ | අවදානම් ඇගයීම | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති සේවක කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2019 අංක 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛය<br>**(i)** ඡේද අංක 2.3.3(අ) | මාස 6 ක පරිවාස කාලයට යටත්ව වර්ෂයක කාලයක් සඳහා වැඩසටහනේ සියලුම පත්වීම් සිදු කර තිබීම හේතුවෙන් සමහර නිලධාරීන් කෙටි කාලයක් තුළ ඉල්ලා අස්වී ඇති බව නිරීක්ෂණය විය. | මධ්‍යම | දුර්වල මානව සම්පත් කළමනාකරණය | රාජ්‍ය සේවයට බැඳීම, රැකියාවේ වැඩි දියුණුව සඳහා, උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වීම, විවාහය, වසර 5 ක ද්විතියනය සේවා කාලය සම්පූර්ණ කිරීම සහ SAPP විසින් පාලනය කළ නොහැකි වෙනත් පෞද්ගලික හේතුන් මත නිලධාරීන්ගේ පෞද්ගලික අභිමතය පරිදි ඉල්ලා අස්වී තිබේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු බව. |
| (ආ) | (ii) ඡේද අංක 2.3.3 (අ) | 2014 අප්‍රේල් 30 වන දින සිට මුදා හරින ලද වැඩසටහනේ මූල්‍ය කළමනාකරු තනතුරේ වසර පහක කාලය 2019 අප්‍රේල් 30 දිනෙන් අවසන් විය. පසුව, ජනාධිපති ලේකම්ගේ 2019 මැයි 02 දිනැති ලිපියට අනුව වැඩසටහනේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අදාළ නිලධාරියා 2019 මැයි 02 දින ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කර තිබුණි. කෙසේ වෙතත්, 2019 ජුනි 23 දිනැති | අඩු | දුර්වල මානව සම්පත් කළමනාකරණය | ඇය රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන තිබුණද, මූල්‍ය කළමනාකරු ලෙස ව්‍යාපෘති සේවය දිගටම කරගෙන යාමට බාධාවක් නොවේ. තවද, ඇය විශ්‍රාම යාමෙන් පසු මූල්‍ය කළමනාකරු ලෙස සේවය දිගටම කරගෙන යාමට කැමැත්ත පළ කර තිබුණි. | රෙගුලාසි වලට අනුකූල විය යුතු අතර රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු රජයේ අවශ්‍යතාවය මත වසර 05 කට නොවැඩි කාලයක් ව්‍යාපෘතියක සේවය කිරීම සඳහා තාවකාලිකව තනතුරෙන් නිදහස් කළ හැකිය. |

අංක PS/ SD/ SAPP/ HR/ 20/2 දරන ලිපියට අනුව ඉහත නිලධාරියා 2019 මැයි 01 සිට 2019 මැයි 23 දක්වා නැවත වැඩසටහනට වාර්තා කර තිබුණි. එම නිලධාරියා 2019 මැයි 23 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමෙන් පසු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් තිබූ නමුත් 2019 මැයි 01 වන දින සිට 2019 මැයි 23 දක්වා අදාළ කාල සීමාව සඳහා වැටුප ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. ඉහත හේතුව නිසා මූල්‍ය කළමනාකරු තනතුර 2019 මැයි 01 සිට 2019 මැයි 23 දක්වා පුරප්පාඩු විය.

මූල්‍ය කළමනාකරු තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියාගේ පත්වීම වසර පහකට පසුවත් අඛණ්ඩව දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2019 ජූලි 01 දින වැටුප් වර්ධකයක් සමඟ නිලධාරියාට වැටුප් ගෙවා තිබුණි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | 2009 අප්‍රේල් 16 සහ 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 සහ 09/2009 (I) | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් නිලධාරීන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා manual පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන තිබුණි. | මධ්‍යම | පැමිණීමේ අක්‍රමිකතා සහ අතිකාල හා නිවාඩු ගෙවීම් අක්‍රමවත් ලෙස ගෙවීමට සිදුවීම. | ඇඟිලි සළකුණු තැබීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට පියවර ගනිමින් තිබේ. | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු තැබීමේ යන්ත්‍ර භාවිතයෙන් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා වාර්තා තබා ගත යුතු බව රජය තීරණය කර තිබේ. |

**3. භෞතික කාර්ය සාධනය**

---------------------------

**3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

-----------------------------------------------------------------

| අනු අංකය | සංරචක | විගණන නිරීක්ෂණ | අවදානම් ඇගයීම | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | සමස්ත භෞතික ප්‍රගතිය | වාණිජ හවුල්කාරිත්වයට ප්‍රවේශය සහ ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය ලෙස වැඩසටහනේ ක්‍රියාකාරකම් සංරචක 02 කින් සමන්විත විය. වැඩසටහන මඟින් සපයන ලද ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී සංරචකයේ සමස්ත භෞතික ප්‍රගතිය | මධ්‍යම | භෞතික කාර්ය සාධනයේ ප්‍රගතිය මන්දගාමී වීම හේතුවෙන් 2023 ජුනි 30 දින වන විට වැඩසටහනේ ඉතිරි අවුරුදු 3½ ක කාලය තුළ වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව අවිනිශ්චිතය. | 2020 අගෝස්තු 31 වන විට සමස්ත ප්‍රගතිය පහත පරිදි බැඳීම් සමඟ 24% කි. එබැවින් Mid-Term Review (MTR) හි IFAD නිර්දේශිත ක්‍රමෝපායන් සහ නව ප්‍රතිපත්තිමය ආරම්භයන් හා මැදිහත්වීම් සමඟ රජය මැදිහත් වීමෙන් සමස්ත ඉලක්කය සපුරා ගැනීමට SAPP වෙත හැකි වේ. | වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට පියවර ගත යුතු බව. |

වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භයේ සිට වසර 2 1/2 ක් ගතවීමෙන් පසුවත් සියයට 11.11 ක් ලෙස පැවතුනි.

| සමස්ත ප්‍රගතිය | වර්ෂ 6 ක ව්‍යාපෘති වටිනාකම | සමුච්චිත බෙදාහැරීම | බැදීම | එකතුව | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| වටිනාකම USD මිලියන | 105 | 13 | ප්‍රදාන - 3.6 ණය 4.2 | 21 | 20 |
| වටිනාකම LKR මිලියන | 17,171 | 2,306 | ප්‍රදාන - 647 ණය 761 | 3,714 | 21 |

COVID වසංගතය තුළ ඇති වූ බාධා හේතුවෙන් 2020 මාර්තු සිට ජූනි දක්වා මාස 4 ක කාලයක් ප්‍රගතිය මන්දගාමී විය.

**(ආ)** සමස්ත මූල්‍ය ප්‍රගතිය

2019 වර්ෂය සඳහා වන මධ්‍යම අයවැය ඇස්තමේන්තුවට අනුව, වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් යටතේ මිලියන 2,044.2 ක් වෙන් කර තිබුණු අතර වැඩසටහනේ සංශෝධිත වාර්ෂික අයවැයෙන් මිලියන 2,600 ක් ඒ සඳහා ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 වන විට වැඩසටහන උපයෝජනය කර තිබුණේ රු. මිලියන 1,654.25 ක් එනම් සියයට 63 ක් පමණි.

භෞතික කාර්ය සාධනයේ ප්‍රගතිය මන්දගාමී වීම හේතුවෙන් 2023 ජුනි 30 දින වන විට වැඩසටහනේ ඉතිරි අවුරුදු 3½ ක කාලය තුළ වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව අවිනිශ්චිතය.

අත්සන් කරන ලද 4P ගිවිසුම් 16 ක බැදීම් සැලකිල්ලට ගැනීමේදී 2011.12.31 වන විට සමස්ත මූල්‍ය ප්‍රගතිය සියයට 21 කි. විස්තර පහත පරිදි වේ .

| සමස්ත ප්‍රගතිය | වර්ෂ 6 ක ව්‍යාපෘති වටිනාකම | සමුච්චිත බෙදාහැරීම | බැදීම | එකතුව | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| වටිනා වටිනාකම USD මිලියන | 105 | 13 | ප්‍රදාන -3.6 ණය -4.2 | 21 | 20 |
| වටිනාකම LKR මිලියන | 17,171 | 2,306 | ප්‍රදාන -647 ණය -761 | 3,714 | 21 |

වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු ඉටුකර කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට පියවර ගත යුතු බව.

සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2011.12.31 දින වාර්ෂික ප්‍රගතිය සියයට 65 කි.

**(ඇ)** ප්‍රදාන බෙදාහැරීම

2019 වර්ෂය සඳහා ප්‍රදාන මධ්‍යම බෙදාහැරීම යටතේ ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5,500 කි. කෙසේ වුවද, වර්ෂය තුළ දී තත්‍ය ප්‍රදාන බෙදාහැර තිබුණේ ප්‍රතිලාභීන් 4.502 අතර පමණක් විය. නිදැලි කුකුළු පාලන ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත ප්‍රතිලාභීන් 500 ක් වූ අතර බෙදාහැරීම් සිදු කරනු ලැබුවේ ප්‍රතිලාභීන් 94 දෙනෙකුට පමණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. තවද, කුරුළු වගාව සඳහා ඉලක්කගත ප්‍රතිලාභීන් 140 ක් වූ අතර ප්‍රදාන බෙදා හැර තිබුණේ ප්‍රතිලාභීන් 40 දෙනෙකු අතර පමණක් විය.

වැඩසටහන් කාලය තුළ යෝජිතයින්ට වෙන් කළ අරමුදල් ප්‍රදානය කිරීමට වැඩසටහනට නොහැකි විය හැක. මේ හේතුවෙන්, උපයෝජනය නොකළ අරමුදල් සඳහා IDA වෙත බැඳීම් ගාස්තු ගෙවීමට භාණ්ඩාගාරයට සිදුවිය

**ප්‍රදාන බෙදාහැරීමේ ප්‍රගතිය**

| **විස්තරය** | **#** | **වටිනාකම රු. මිලියන** |
|---|---|---|
| 4P ව්‍යාපෘති අත්සන් කර ඇති ගිවිසුම්ගත කාලය තුළ ප්‍රතිලාභීන් | 16 15,72 9 | 970 |
| ප්‍රතිලාභීන් ඉලක්කය 2011.12.31 දක්වා | 5,500 | 446 |
| ප්‍රදාන බෙදා හැර ඇති | 4,502 | 161 |
| අතැති ඉල්ලීම් | 66 | 3 |
| ප්‍රගතිය | 82 | 36 |

එකඟ වූ කොන්ත්‍රාත් කාලය තුළ ගොවීන් 500 ක් සඳහා රැකියා සැපයීම සඳහා 2019 ජනවාරි මාසයේදී Backyard Poultry Farming Project ගිවිසුම අත්සන් කරන ලද අතර 2019 වර්ෂයේ ඉලක්කය ගොවීන් 250 කි. 2019 දෙසැම්බර් 31 වන විට ගොවීන් 94 දෙනෙකු සඳහා ප්‍රදානය රු. මිලියන 5.8 කි. ගොවීන් 350 දෙනෙකු මේ වන විට (2016.08.31) ව්‍යාපෘතියේ විවිධ අදියරවල භෞතිකව නිරත වී ඇත.
එකඟ වූ කොන්ත්‍රාත් කාලය තුළ ගොවීන් 140 දෙනෙකුට රැකියා සැපයීම සඳහා කුරුළු ව්‍යාපෘතිය 2019 පෙබරවාරි මාසයේදී අත්සන් කරන ලද අතර 2019 වර්ෂයේ ඉලක්කය ද ගොවීන් 140 කි. 2019 දෙසැම්බර් 31 වන විට ගොවීන් 40 දෙනෙකු සඳහා බෙදාහරින ලද ප්‍රදාන රු. මිලියන 2.26 ක් විය. මේ වන විට (2016.08.31) ගොවීන් 61 දෙනෙකුට රු. මිලියන 3.45 ක ප්‍රදාන නිදහස් කර තිබුණු අතර ගොවීන් 142 දෙනෙකුට ණය නිකුත් කර තිබුණි.

වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු ඉටුකර කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට පියවර ගත යුතු බව.

<table>
<tr>
<td>(d)</td>
<td>ණය සංරචකය</td>
<td>ණය සංරචකය යටතේ 2019 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් 15,223 ක් ආවරණය කරමින් රාජ්‍ය-පෞද්ගලික-නිෂ්පාදක-හවුල්කාරිත්ව ගිවිසුම් පහළොවක් අත්සන් කර තිබුණද, වැඩසටහන විසින් 2019 දෙසැම්බර් 31 දක්වා ණය ලබා දීම සඳහා ප්‍රතිලාභීන් 7,499 ක් ඉලක්ක කර තිබුණු අතර ඉන් ප්‍රතිලාභීන් 6,091 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී තිබුණු අතර ප්‍රතිලාභීන් 5,219 කට පමණක් රු. මිලියන 1,037 ක් ණය ප්‍රදානය කර තිබුණි .</td>
<td>මධ්‍යම</td>
<td>වැඩසටහන් කාලය තුළ යෝජිතයින්ට වෙන් කළ අරමුදල් ප්‍රදානය කිරීමට වැඩසටහනට නොහැකි විය හැක. මේ හේතුවෙන්, උපයෝජනය නොකළ අරමුදල් සඳහා IDA වෙත බැඳීම් ගාස්තු ගෙවීමට භාණ්ඩාගාරයට සිදුවිය</td>
<td>ණය ප්‍රගතිය (4 p සහ තරුණ ණය)
<table>
<tr><th>විස්තරය</th><th>ගණන</th><th>වටිනාකම රු. මිලියන</th><th>ප්‍රගතිය %</th></tr>
<tr><td>4P ණය ප්‍රගතිය</td><td></td><td></td><td></td></tr>
<tr><td>4P ව්‍යාපෘති අත්සන් කර ඇති</td><td>15</td><td></td><td></td></tr>
<tr><td>4P ගිවිසුම් කාලය තුළ ප්‍රතිලාභීන්</td><td>15,223</td><td>1,980</td><td></td></tr>
<tr><td>4P ප්‍රතිලාභීන් 31.12.2019 දක්වා ඉලක්ක</td><td>7,499</td><td>1,300</td><td>100</td></tr>
<tr><td>4P සඳහා CBSL හි ගොවීන් ලියාපදිංචි කර ඇති</td><td>6,091</td><td>1,105</td><td>96</td></tr>
<tr><td>ණය බෙදාහැර ඇති PFI</td><td>5,219</td><td>1,037</td><td>82</td></tr>
<tr><td>CBSL විසින් ප්‍රතිමූල්‍යකරණය කරන ලද</td><td>4,916</td><td>980</td><td>76</td></tr>
<tr><td>තරුණ ණය ප්‍රගතිය</td><td></td><td></td><td></td></tr>
<tr><td>2011.12.31 දක්වා ඉලක්කය</td><td>500</td><td>185</td><td>100</td></tr>
<tr><td>Youth Loans Registered</td><td>299</td><td>151</td><td>81</td></tr>
<tr><td>තරුණ ණය ලියාපදිංචි කර ඇති</td><td>66</td><td>32</td><td>17</td></tr>
<tr><td>තරුණ ණය ප්‍රතිමූල්‍යකරණය</td><td>33</td><td>14</td><td>8</td></tr>
<tr><td>ආදායම් උත්පාදනය (IG) ණය ප්‍රගතිය</td><td></td><td></td><td></td></tr>
<tr><td>IG ණය බෙදා හැරීම</td><td>527</td><td>106</td><td></td></tr>
</table>
</td>
<td>වැඩසටහන් කාල සීමාව තුළ වැඩසටහනේ අරමුණු ඉටුකර කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට පියවර ගත යුතු බව.</td>
</tr>
</table>

සහ ප්‍රතිමූල්‍යකරණය
කිරීම

## 3.2 ක්ෂේත්‍ර චාරිකාවලදී කරනු ලැබූ නිරීක්ෂණ

| අනු අංකය | විගණන නිරීක්ෂණ | අවදානම් ඇගයීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගෝනගල කෘෂිකාර්මික ඵලදායිතා ගම්මානයට අදාළ ගිවිසුමේ දක්වා ඇති නිදහස්කිරීමේ සැලැස්මට අනුව boiling barrel, උපාංග සහ වීල්බැරෝ 2019 සැප්තැම්බර් මාසය තුළ ලබා දීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එකඟ විය. කෙසේ වෙතත්, 2019 වර්ෂය අවසන් වනතුරු එවැනි උපකරණ බෙදා හැර නොතිබුණි. | මධ්‍යම | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | පිරිවිතරයන් තීරණය කර භාණ්ඩ මිල දී ගැනීම සහ බෙදා හැරීම සඳහා ප්‍රවර්ධකයා වෙත ඉදිරිපත් කර ඇත. අස්වනු නෙලීම 2020 මාර්තු මාසයේදී ආරම්භ කිරීමට නියමිතය. අස්වැන්න නෙළීමට පෙර ප්‍රවර්ධකයා ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිතය. | ගිවිසුම් හා බෙදාහැරීමේ සැලැස්ම අනුව ඉලක්ක සපුරා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |
| (ආ) | ගෝනගල කෘෂිකාර්මික ඵලදායිතා ගම්මානයට සම්බන්ධ ගිවිසුමේ 2 (ආ) වගන්තියට අනුව, ණය සඳහා උපරිම පොලී අනුපාතය වාර්ෂිකව සියයට 6.5 ක් වන නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ප්‍රතිමූල්‍යයන දිනය දක්වා ප්‍රවර්ධන බැංකුව සියයට 16 ක පොලී අනුපාතයක් අය කර තිබුණි. | මධ්‍යම | වැඩි පොලී අනුපාතයක් අය කිරීමෙන් ගොවීන්ට බලපෑම් ඇතිවීම. | බැංකුව විසින් ණය මුදල ඔවුන්ගේ සාමාන්‍ය අනුපාතයට මුදා හරින ලද අතර පසුව 4P ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු සියයට 6.5 ක SAPP පොලී අනුපාතයක් බවට පරිවර්තනය විය.. | ගිවිසුමට අනුව පොලී අනුපාතය අවම කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ගෝනගල කෘෂිකාර්මික ඵලදායිතා ගම්මානයට අදාළ රක්ෂණයක් ලබා දීම සඳහා එක් එක් බැංකු ගිණුම්වල රු. 2,770 ක් රඳවාගෙන තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය දක්වා එවැනි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මධ්‍යම | ආපදාව හේතුවෙන් අනපේක්ෂිත අලාභයක් ගොවීන්ට බලපෑම් ඇතිවීම. | බැංකුව සඳහන් කළ පරිදි රක්ෂණ වාරිකය ලෙස රඳවා ගත් රු. 2,770 ක් ප්‍රතිලාභීන් වෙත මුදා හරිනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතු බව. |
| (ඈ) | නිදැලි කුකුළු පාලන ව්‍යාපෘතියට අදාළව 2018 දෙසැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා බෙදා හැරීමේ සැලැස්ම සැලසුම් කර තිබුණි. ඊට අදාළ ගිවිසුම් 2019 ජනවාරි 04 සහ 2019 පෙබරවාරි 26 දින අත්සන් කර තිබුණි. | මධ්‍යම | මෙය නීතිමය ගැටළු ඇතිවීමට හේතු විය හැක. | සාමාන්‍යයෙන්, NSC අනුමැතිය සහ IFAD විරෝධතා නොමැති බවට සහතිකය ලද පසු 4P ගිවිසුම් සකස් කිරීම ආරම්භ කර ඇති අතර ඒ සමඟම හඳුනාගත් ගොවීන් සමඟ මූලික භූමි කටයුතු ආරම්භ කරනු ලැබේ. ගිවිසුම් අත්සන් කිරීම රඳා පවතින්නේ කාර්යබහුල නිලධාරීන්ට කාලවේලාව ඇති ආකාරය අනුව වේ. | නියමිත කාලය තුළ බෙදා හැරීමේ සැලැස්ම මත පදනම්ව ගිවිසුම් අත්සන් කිරීමට කඩිනම් පියවර ගත යුතු බව. |
| (ඉ) | කිරි ආහාර ව්‍යාපෘතිය සඳහා වන ගිවිසුමේ 10 (අ) ඡේදයට අනුව ව්‍යාපෘති කාලය වර්ෂ දෙකකි. වර්ෂයක කාලයක් ගතවී තිබුණද, 2019 දෙසැම්බර් 31 දින දක්වාත් කිසිදු ගොවියෙකු මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ගිවිසුමේ නිදහස් කිරීමේ සැලැස්මට අනුව, පිළිවෙලින් 2018 දෙසැම්බර්, 2019 ජනවාරි සහ 2019 පෙබරවාරි මාසය වන විට ප්‍රතිලාභීන්ට ප්‍රදාන භාණ්ඩ ලබා දීමට ව්‍යාපෘතියේ | මධ්‍යම | ක්‍රියාකාරකම් ප්‍රමාද වීමට මෙය හේතු විය හැක. | ප්‍රවර්ධන සමාගම, භූගෝලීය ප්‍රදේශය සහ ගිවිසුමෙහි ආදර්ශ අත්සන් 2018 අගෝස්තු 18 දින වෙනස් කළ යුතුය. එබැවින් සංශෝධන නිම කිරීමට කාලය ගතවේ. CRIB සහ ණය අනුමත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ගොවීන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. | ප්‍රමාදය අවම කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පාර්ශව එකඟ වී තිබුණි. කෙසේ වුවද, නිදහස් කිරීමේ සැලැස්මට අනුව වැඩසටහනේ කිසිදු පාර්ශ්වයකට කාල ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | | | | |
| **(ඊ)** | කුරුඳු වගාවට අදාළ ගිවිසුමේ 3 (ඉ) ඡේදයට අනුව, ණය ආපසු ගෙවීම සඳහා ඇපකරු ලෙස ප්‍රවර්ධකයා ක්‍රියා කළ යුතුය. සමහර ප්‍රතිලාභීන් ණය ආපසු ගෙවීම පැහැර හැර ඇති බවත්, එම නිසා ශේෂ ණය මුදල නිදහස් කිරීම ප්‍රවර්ධන බැංකුව විසින් නවතා දමා ඇති බවත් නිරීක්ෂණය විය . තවද, ඉහත ගිවිසුමේ 2 (අ) (ii) වගන්තිය ප්‍රකාරව ප්‍රවර්ධන සමාගම විසින් සැකසුම් මධ්‍යස්ථානය පිහිටුවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට සමිතිවලට අදාළ සැකසුම් මධ්‍යස්ථාන කිසිවක් ස්ථාපිත කර නොතිබුණි | මධ්‍යම | ව්‍යාපෘතියේ ප්‍රගතියට දැඩි ලෙස බලපානු ඇත. | මේ සම්බන්ධයෙන් PMU විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ණය අයකර ගැනීම් සඳහා PFI ද වගකීමට බැඳී සිටී. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී බැංකු නිලධාරීන් ඇතුළු සියලුම ප්‍රධාන හවුල්කරුවන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර මෙම ගැටළුව විසඳන ලද අතර SAPP විසින් බිම් මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් පසු විපරම් කිරීම සඳහා Value Chain Mobilizer භාවිතා කරන ලදි. | පසු විපරම් කිරීමට පියවර ගත යුතු බව. |
| **(උ)** | තේ අඩු සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ 2019 ඔක්තෝබර් 10 දින වන විට ප්‍රතිලාභීන් 500 ක් හඳුනාගෙන තිබුණද, ප්‍රතිලාභීන් 119 ක් පමණක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර ඇති අතර තේ වගාකරුවන් 31 දෙනෙකුට වර්ෂය අවසානයේ දී ණය නිකුත්කර තිබුණි. | මධ්‍යම | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | වරින් වර බැංකු විසින් පනවා ඇති නීති රීති හා කොන්දේසි හේතුවෙන් ගොවීන්ට මෙම අවස්ථාව අහිමි විය. මෙම අරමුණ සඳහා ගොවීන් තමන්ගේම අරමුදල් භාවිතා කරයි. | ගිවිසුම් අනුව ඉලක්ක සපුරා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |
| **(ඌ)** | උක් ගොවීන් ශක්තිමත් කිරීම සඳහා 2018 ජුනි 28 දින ජනාධිපති ලේකම් සහ සීමාසහිත ගල්ඔය වැවිලි සමාගම අතර | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ඇති කරගත් ගිවිසුමේ 2 (ආ) වගන්තියට අනුව, ක්‍රියාකාරකම් අටක් සිදු කිරීම සඳහා උක් ගොවීන් 4,000 කට සියයට 6.5 ක අනුපාතයකින් මාස 12 ක උපරිම කාල සීමාවකින් ආපසු ගෙවීම සඳහා එක් ගොවියෙකුට රු.230,915 ක් බැගින් ණය ලබාදිය යුතුව තිබුණි. කෙසේ වුවද, ගොවීන් 3,734 ක් පමණක් 2019 ඔක්තෝබර් 10 දක්වා රු. මිලියන 858.82 ක් වූ ණය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | | | |
| **(i)** ණය ක්‍රියාකාරකම්වල අපේක්ෂිත කාල රාමුව සැලකිල්ලට නොගෙන වැඩසටහන විසින් සම්පූර්ණ අස්වනු පිරිවැය එකවර නිකුත් කර තිබීම හේතුවෙන් අවම වශයෙන් මාස 9 ක කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර රු. 380,868,000 (102,000*3,734) ක් ප්‍රවර්ධක සමාගම විසින් රඳවාගෙන තිබුණි. | මධ්‍යම | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | උක් වගා කිරීමේ සැලැස්ම සකස් කර ඇත්තේ උක් සැකසුම් කම්හලේ දෛනික අවශ්‍යතාවය පදනම් කරගෙන වේ. ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට මූලික වශයෙන් එකඟ වී ඇති බැවින් SAPP අනුමැතිය අපේක්ෂා කරමින් සමාගම ඔවුන්ගේ වගා වැඩසටහන ආරම්භ කරන ලදි. ණය සංරචකය අනිසි ලෙස භාවිතා කිරීමට අවස්ථාවක් නොමැති අතර ව්‍යාපෘති සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අදියරේදී ගනු ලැබූ ගොවීන්ගේ එකඟතාවය මත පදනම්ව සමාගමට ණය සංරචක නිකුත් කරන ලදී. | අරමුදල් උපයෝජනය කිරීම හා කාල රාමුව තුළ ක්‍රියාකාරකම් නිම කිරීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| **(ii)** අතුරු බෝග වගාව සඳහා බීජ මිලදී ගැනීම සඳහා මිලියන රු.58.81 ක | මධ්‍යම | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් | සමාගම බීජ මිලදී ගෙන ගොවීන් අතර බීජ බෙදා හැර ඇත. අතුරු බෝග වගාව සාර්ථකව කළ ගොවීන් සාධාරණ | අරමුදල් මනා ලෙස උපයෝජනය කිරීම හා අතුරු බෝග වගාව |

| | | | | |
|---|---|---|---|---|
| | මුදලක් ගොවීන් වෙත නිදහස් කර තිබුණද, ප්‍රවර්ධක සමාගම අතුරු බෝග වගා කටයුතු සඳහා අවශ්‍ය බීජ ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් ලබා දී ඇති ණය ප්‍රමාණය විගණිත දිනය වන 2019 ඔක්තෝම්බර් 10 දින වන විටද අතුරු බෝග වගා කටයුතු සඳහා භාවිතා නොකර ගොවීන් විසින් රඳවාගෙන තිබුණි. | කරගත නොහැකි වීම. | ආදායමක් උපයා ගෙන තිබේ. | සඳහා බීජ සැපයීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| **(එ)** | මුරුංගා වගාවට අදාළව ජනාධිපති මධ්‍යම ලේකම්, Dasini Dehydration Center සහ ලංකා බැංකුව සමග ඇති කරගත් ගිවිසුමේ 2 (ඇ) ඡේදයට හා 03 වන උපලේඛනයට අනුව නිදහස් කිරීමේ සැලැස්මේ පළමු අදියරේදී ප්‍රතිලාභීන් 250 ක් සඳහා 2018 නොවැම්බර් මාසයේ දී ද ශේෂ ප්‍රතිලාභීන් 250 සඳහා 2019 මැයි මස දී ද ප්‍රදාන සහ ණය පහසුකම් ලබා දීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිලාභීන් 97 දෙනෙකු සඳහා 2019 දෙසැම්බර් 31 වන විට ලබා දී ඇත්තේ රු. මිලියන 9.33 ක් වූ ණය පහසුකම් පමණි. | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | කාර්යබහුල කාර්යභාරයන් ඇති පාර්ශව දෙකක් සහභාගි විය හැකි ආකාරය අනුව 4P ගිවිසුම සකස් කර අත්සන් කර තිබේ. භූමියේ වැඩ ආරම්භ කිරීම සඳහා ගිවිසුම අත්සන් කිරීමට බලා සිටීම තුළ කන්නය තුල වැඩ ආරම්භ කිරීම අහිමි වනු ඇත. CBSL හි ගොවීන් ලියාපදිංචි කිරීම සඳහා CRIB සහ වෙනත් ගැටළු අහිතකර ලෙස බලපා ඇති අතර මේ හේතුවෙන් සමස්ත ක්‍රියාවලිය මාස 3-4 කින් මාරු වී තිබේ. | ගිවිසුම් අනුව ඉලක්ක සපුරා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |
| **(ඒ)** | මුරුංගා වගාවට අදාළව ජනාධිපති මධ්‍යම ලේකම්, Dasini Dehydration Center සහ ලංකා බැංකුව සමග ඇති කරගත් ගිවිසුමේ 3 (ඔ) ඡේදයට අනුව ප්‍රවර්ධකයා මාසික ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කළ යුතු විය. | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | 2019 දෙසැම්බර් වාර්තාව මේ වනවිට ඉදිරිපත් කර තිබේ. 2020 වර්ෂයේදී ක්‍රමානුකූලව වාර්තා ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දී ඇත. | ප්‍රවර්ධකයන් විසින් මාසික ප්‍රගති වාර්තා කාල රාමුව තුළ ඉදිරිපත් කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කෙසේ වුවද, විගණිත දිනය වන 2019 ඔක්තෝබර් 28 දින තෙක් කිසිදු ප්‍රගති වාර්තාවක් ප්‍රවර්ධකයා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | | | | |
| (ඔ) | රාජ්‍ය මුද්‍රණ සංස්ථාවෙන් මුද්‍රණය කරන ලද පිරිවැය රු. මිලියන 1.36 ක් වූ 14,830 න් ස්ව අධීක්ෂණ වාර්තා පොත් ප්‍රතිලාභීන් වෙත බෙදා හැර ඇත්තේ පොත් 4,547 ක් පමණක් වන අතර ඉතිරි පොත් 10,283 ක් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ ගබඩා පරිශ්‍රයේ ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර 2020 මාර්තු 24 දක්වා ම ඉතිරිව පැවතුණි. | මධ්‍යම | වැඩසටහන් කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වීම. | 4P හවුල්කාරිත්වයේ භෞතිකව නියැලී සිටින ගොවීන් අතර බෙදා හැරීම සඳහා තොග මුද්‍රණය කර ගබඩාවල තබා තිබේ. | ප්‍රතිලාභීන් වෙත කාල රාමුව තුළ මුද්‍රිත ස්වයංක්‍රීය අධීක්ෂණ පොත් බෙදා හැරීම සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතු බව. |